සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 45 | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

## Third Term Test - Grade 13 - 2016

විභාග අංකය .............................

## බෞද්ධ ශිෂ්ටාචාරය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගනෙ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

**(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)**

1. i. බ්‍රාහ්මණ වර්ණයට හිමි ස්වධර්ම නිවැරදිව දක්වන්න..
   ii. බුදුසමයෙන් ආශ්‍රම ධර්ම ප්‍රතික්ෂේප කෙරෙන අයුරු නිදසුන් දෙකක් මගින් පෙන්වා දෙන්න.
   iii. මානව වර්ගයාගේ ඒකත්වය සමාජ විද්‍යානුකූලව බුද්ධ දේශනා අනුසාරයෙන් සනාථ කරන්න.
   iv. බුද්ධකාලීන භික්ෂුණී ශාසනයේ සමෘද්ධිය නිදසුන් දෙකක් මගින් පහදන්න.
   v. සංජයබෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ දර්ශනය කෙටියෙන් පහදන්න.

2. i. ශ්‍රමණ සම්ප්‍රදායෙන් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණ හතරක් පෙන්වා දෙන්න.
   ii. බුදුසසුනේ උන්නතිය සඳහා සිටුවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහයන් පිළිබඳ විමසීමක් කරන්න.
   iii. වාණිජ ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් සමාජය තුළ නව ප්‍රවණතා බිහිකරලීමට හේතු වූ අයුරු විස්තර කරන්න.
   iv. උදාර රාජ්‍ය පාලකයකු නිර්මාණය වීම කෙරෙහි සතර අගති විරතිය උපයෝගී වන අයුරු පහදන්න.
   v. අගහිගකම මිනිසා අපරාධවලට පොළඹවන ආකාරය පැහැදිලි කරන්න.

3. i. සදාචාර සංවර්ධනය උදෙසා ගිහිපැවිදි සම්බන්ධතාවයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.
   ii. සතර කර්මක්ලේස කවරේදැයි සැකෙවින් දක්වන්න.
   iii. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව දියුණුවට උපකාරී වන චතුර්විධ සම්ප්‍රදායන් මොනවාදැයි ගෙනහැර දක්වන්න.
   iv. භික්ෂු සංඝ හා ශ්‍රාවක සංඝ අතර ඇති වෙනස පැහැදිලි කරන්න.
   v. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් උදෙසා විනය නීති පැනවීමට හේතු වූ කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

## II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න තුනක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)

4. i. දෙලොව අභිවෘද්ධිය උදෙසා දසපුණ්‍ය ක්‍රියාවල ඇති වටිනාකම පහදා දෙන්න.
   ii. පිරිස් කළමනාකරණය හා ආපදා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වර්තමාන සමාජයේ බොහෝ ගැටලු අවම කරගැනීම සඳහා උපයෝගීවන ආකාරය පහදන්න.
   iii. බුදු දහමේ සඳහන්වන ස්වභාව සෞන්දර්ය රසාස්වාදය පරිසර හිතකාමී මිනිසෙකු බිහිකිරීමට උපකාරිවන අයුරු විමසීමට ලක්කරන්න.
   iv. ශ්‍රමය සමාජයේ යහපත පිණිස යොමු කරවන බෞද්ධ ඉගැන්වීම් කවරේදැයි පැහැදිලි කරන්න.

5. i. බුදුරදුන් තුළ පැවැති අසමසම නායකත්ව ලක්‍ෂණවල පවත්නා සර්වකාලීන වටිනාකම අගයන්න.
   ii. ධර්ම සන්නිවේදනයෙහිලා බුදුරදුන් ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකාරක හා උපමා රූපක භාවිතා කර ඇති ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.
   iii. ධර්ම දූත කාර්යෙහිලා බුද්ධකාලීන ශ්‍රාවකයන් වහන්සේලාගේ මෙහෙවර අගයන්න.
   iv. "බුදුරදුන් පිළිබඳව තත්කාලීන පිරිස් විසින් කළ ඇගයීම් තුළින් බුද්ධ චරිතයෙහි ඇති සුවිශේෂී ගුණාංග පිළිබිඹු කරයි" විමසීමට ලක්කරන්න.

6. i. "ප්‍රථම ධර්ම සංගායනාව ශාසන ඉතිහාසයේ සංධිස්ථානයක් ලෙස සැළකිය හැකිය." සාකච්ඡා කරන්න.
   ii. කණිෂ්ක රජු විසින් සිදුකරන ලද ශාසනික මෙහෙවර ඇගයීමට ලක්කරන්න.
   iii. මහින්දාගමනයට පෙරාතුව මෙරට බුදුසසුන පැවැතුනේදැයි සාකච්ඡා කරන්න.
   iv. "ශ්‍රී ලාංකීය රජවරුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ බුදුසසුනේ ආරක්‍ෂාව හා චිරස්ථිතිය සැලස්වීමයි.'' පැහැදිලි කරන්න.

7. i. ථායි සංස්කෘතිය පෝෂණයට බුදුසමයෙන් ලැබුණු අනුග්‍රහය විමසන්න.
   ii. බුදුසමයේ සංවර්ධනය සඳහා චීන රජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය පැහැදිලි කරන්න.
   iii. ථෙරවාදී බුදුදහම ආරක්‍ෂාකර ගැනීමට මහාවිහාරයෙන් ලැබුණු අනුග්‍රහය විමසීමට ලක්කරන්න.
   iv. අතීතයේ ලාංකීය ජන සමාජය දහමට අනුගතව තම ජීවන රටාව පවත්වාගෙන ගිය අයුරු අගය කරන්න.

8. i. ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවය කෙරෙහි බල පෑ ඓතිහාසික පසුබිම පැහැදිලි කොට ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාවේ සුවිශේෂතා ප්‍රකට කරන්න
   ii. විහාරස්ථානවල නිමවා ඇති ප්‍රතිමා ගෘහය ජන විඥ්ඥාණය පෝෂණය කරන ධර්ම සන්නිවේදන මධ්‍යස්ථානයක් ලෙස අගය කළ හැකි ද යි පරීක්‍ෂා කරන්න.
   iii. ජාතක කතා හුදෙක් සාහිත්‍යය රස ජනනය කිරීමට පමණක් සීමා නොවී සාරධර්ම පෝෂණයට දායක වූ අයුරු නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.
   iv. සිංහල සංදේශ කාව්‍ය සාහිත්‍යයෙන් පිළිබිඹුවන බෞද්ධ සළකුණු පිළිබඳ විවරණයක් සපයන්න.